* ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීමේ තරග විභාග සඳහා පෙනී සිටි වාර ගණන ගණනය කරනු ලබන්නේ අංක 1928/28 හා 2015.08.21 දිනැති නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ දින සිට වේ.
* අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2021.09.03** වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.
* අදාළ සියලු සුදුසුකම් 2021.07.30 වැනි දිනට සම්පූර්ණ කළ යුතු ය.
* 2021.07.30 දින හෝ ඊට පෙර අයදුම්පත් යොමු කරන ලද අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

ඉහත සංශෝධනයන්ට අමතරව සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වූ තරග විභාගය සඳහා පහත සඳහන් සංශෝධනයන් ද අදාළ වේ.

*ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සීමිත තරග විභාගය - (2020/2021)*

09. (iii) යටතේ දැක්වෙන වගුව 03හි 11 - ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය විෂයය යටතේ පොදුවේ සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම්වලට අමතරව එම විෂයයට පමණක් අදාළ වන පරිදි පහත සුදුසුකම් ද ඇතුළත් කරනු ලැබේ.

(iii) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබාගත් මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය හෝ

(ආ) අධ්‍යාපනවේදී විශේෂ උපාධිය සඳහා මුළු විෂයය ඒකක සංඛ්‍යාවෙන් 1/3ක් වත් ආවරණය වන පරිදි උපදේශනය හෝ මනෝවිද්‍යාව යන විෂයයන් හදාරා තිබීම.

09. (iii) යටතේ දැක්වෙන වගුව 03ට පහතින් නව සටහනක් ඇතුළත් කරනු ලැබේ.

*සටහන.*- විශේෂ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් උක්ත වගුවේ නියමිත විෂයය ක්ෂේත්‍රයට අදාළ එක් අධ්‍යාපන සුදුසුකමක් හෝ නියමිත විෂයය ක්ෂේත්‍රයට අදාළව 4.1 (ආ) හි සඳහන් අධ්‍යාපන සුදුසුකමක් හෝ සපුරා තිබිය යුතුය.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2021 අගෝස්තු මස 10 වැනි දින.

08-412

---

**සංශෝධනයයි**

**අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙහි නීති නිලධාරී (විධායක සේවා ගණයේ III ශ්‍රේණිය) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2021**

අංක 2,237 හා 2021.07.16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද උක්ත කරුණ පිළිබඳ වූ නිවේදනය සම්බන්ධයෙනි.

එම නිවේදනයෙහි 8(i) ඡේදයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2021 සැප්තැම්බර් මස 10 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

මෙම තනතුරට මේ වන විටත් අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීමෙන් වළකින මෙන් දන්වනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ ලේකම්,

2021 අගෝස්තු මස 20 වැනි දින,
අමාත්‍ය මණ්ඩල කාර්යාලය.
ජනරජ ගොඩනැගිල්ල,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.